# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1501/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 22/09/2024
පැය 1410

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - මිරිහාන පොලිස් වසම.

2024.09.22 වන අද දින අළුයම් කාලයේ මිරිහාන පොලිස් වසමේ උඩහමුල්ල ප්‍රදේශයේදී පුද්ගලයෙකු පහරදී ඝාතනය කර ඇති බවට මිරිහාන පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු වයස අවුරුදු 43 ක් වූ උඩහමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු හා තවත් පුද්ගලයෙකු අතර ඇතිවූ බහින්බස් වීමක් දුරදිග ගොස් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදු කර ඇති බවට විමර්ශන වලදී අනාවරණය වි ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. දියේ ගිලී මියයාම - රත්නපුර පොලිස් වසම.

2024.09.21 වන දින දහවල් කාලයේ රත්නපුර පොලිස් වසමේ හෙට්ටිකන්ද ප්‍රදේශයේදී කැකුණගහදොලට වැටි පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට රත්නපුර පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 32 ක් වූ හෙට්ටිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘතශරිරය රත්නපුර රෝහලේ මෘතශරිරාගාරයේ තැන්පත් කර ඇත. රත්නපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - රත්නපුරය පොලිස් වසම.

2024.09.21 වන දින උදෑසන කාලයේ රත්නපුර පොලිස් වසමේ රත්නපුර පැල්මඩුල් ප්‍රධාන මාර්ගයේ ලෙල්ලුපිටිය ප්‍රදේශයේදී පැල්මඩුල්ල දෙස සිට රත්නපුරට දෙසට ධාවනය වූ ලොරි රථයක රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ දකුණ පසට ගොස් ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි ත්‍රිරෝද රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රිරෝද රථ රියදුරු රත්නපුර රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 42 ක් වූ මංකඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රත්නපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. රත්නපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - දුම්මලසූරිය පොලිස් වසම.

2024.09.21 වන දින අළුයම් කාලයේ දුම්මලසූරිය පොලිස් වසමේ දුම්මලසූරිය පඩිවෙල මාර්ගයේ පඩිවෙල හන්දිය ආසන්නයේදී දුම්මලසූරිය දෙස සිට පඩිවෙල දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගයෙන් ඉවතට පැන කාණුවකට වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු කුලියාපිටිය රෝහලට ඇතුලත් කිරිමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ ඇතුන්ගහකොටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය කුලියාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, දුම්මලසූරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**